# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

**නො. 8,189 — 1936ක්වූ ජනවාරි මස 3 වෙනි දිනවූ සිකුරාදා.**


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## මැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 831

කැලණිගඟේ මෝය අසල පිහිටි නොම්බර A 564 දරණ මුල් පිහියමේ සඳහන්වූ අක්කර 4, රූඩ් 2, පර්චස් 10·84ක් ප්‍රමාණ ඇති ආණ්ඩුවට අයිති ඉඩමේ තිබෙන පොල්ගස්වල බද්ද මෙහි පහත සඳහන්වූ කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1936ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුදු 3කට බදු ගැනීම පිණිස එවනු ලබන ඉල්ලුම්පත්‍ර වර්ෂ 1936ක්වූ ජනවාරි මස 13වෙනි සඳුදා දවල් 11ට වනතුරු, බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් කොළඹ කච්චේරියේදී භාරගන්නා බව මෙයින් දැනුම්දෙමි. "කැලණිගඟේ මෝය අසල ආණ්ඩුවේ පොල් වත්ත" යනු පිට සඳහන්කළ කවරවල ඉල්ලුම්පත්‍ර දමා මුද්‍රාකළ යුතුයි.

1. තෝරාගන්නාලද බදු ගැනුම්කාරයා විසින් විකුනුම් දිනේදීම හය මාසයක බදු මුදල් ගෙවිය යුතුයි. එම මුදල බද්දේ අන්තිම කාර්තු දෙකේ බදු මුදලට හිලව්කරනු ලැබේ. බදු මුදල් සෑම කාර්තුවේම පටන්ගැනීමට පළමුව ගෙවිය යුතුයි. බදුකාරයා විසින් පහත සඳහන් යම් කොන්දේසියක් කඩකළොත්, එසේ කලින් ගෙවනලද සම්පූර්ණ මුදල හෝ එයින් කොටසක් තක්සේරුකොට නියමකරනා අලාභ වශයෙන් රජසන්තකකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

2. බදු ගැනුම්කාරයාට අයිතිව තිබෙන්නේ පොල්ගස්වල ගෙඩි පමණක්ය.

3. බදු ගැනුම්කාරයා විසින් හෝ ඔහුගේ වැඩකරුවන් විසින් නොපැසුනු ගෙඩි කැඩීම තහනම්ය.

4. දැනට පවතින වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගසක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටවත් අවසර නැත.

5. බදුගැනුම්කාරයා ඉඩමේ වල්පැළෑටි උදුරා ඉඩම සුබ පවිත්‍රව හොඳකාර තබාගන්ට ඕනෑවා සහ නාගරික සභාවේ අණපනත්වල හැටියට ක්‍රියාකරන්ටත් ඕනෑය. තවද ගෙවියයුතු අයබදු ගෙවන්ට ඕනෑය.

6. හරකුන්ගෙන් නොතේරෑන සියලුම පොල්පැල බදු ගැනුම්කාරයා ප්‍රවේසම්කරන්ට ඕනෑවත් ඇර වැටවල් හොඳකාර අලුත්වැඩියාකරන්ටත් ඕනෑය.

7. යම් පොල්පැලයක් හරක්කන්ට සෑදුනොත් එසේ උනාවූ අලාභය වෙනුවට එක පැලේට රුපියල බැගින් බදු ගැනුම්කාරයා ගෙවන්ට ඕනෑය.

8. ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත් ලියවිල්ලක් පිට අවසරයක් ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ටවත් අතුරු බද්දකට දෙන්ටවත් බදු ගැනුම්කාරයාට අවසර නැත.

9. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් අවසර නැතුව කිසිම ගොඩනැගිල්ලක් සාදන්ට බැරිය.

10. ඉඩමේ තිබෙන පස්, වැලි යනාදිය අහක්කරගන්ට හෝ විකුණන්ටවත් බදුගැනුම්කාරයාට අවසර නැත.

11. ඉඩම ගඟට සේදීයාමට හේතුවන කිසිම ක්‍රියාවක් කිරීමට බදුකාරයාට තහනම්ය.

12. මුළු ඉඩම හෝ එහි යම් කොටසක් ආණ්ඩුවට ඕනෑ කළොත් සුමානයක් කල්දැන්වීම එවැනි ඉඩම හෝ ඉඩම් කොටස ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම් කොටසට ගණවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවන්ට සලසනවා ඇත.

13. ඉහත සඳහන්වූ කොන්දේසි කඩකළොත් වන්දි මුදල් ලබා නොගෙන බදු ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අයින්කර ඉඩමේ නැවත භුක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

14. බද්ද ඉකුත්වූ සැනින්ම ගස්වල කිසිම අලාභහානියක් නැතුව ඒජන්ත උන්නාන්සේට හෝ උන්නාන්සේගෙන් බලයලත් මුලාදැනියෙකුට හොඳකාර ඉඩමේ භුක්තිය භාරදිය යුතුයි.

15. බදු ඉල්ලුම්කාරයෝ පැමිණ සිටිය යුතුයි. පිළිගත හැකි අන්දමේ ඉල්ලුම්පත්‍රයක් නොලැබුනොත් බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එම විකිණීමේදී වැඩි ඉල්ලුම සාධාරණයක නොවේනම් එය ප්‍රතික්ෂේපකිරීමට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

16. මෙම ඉඩමේ කිරිඑළදෙනුන් තබා කැවීම තහනම්ය.

ආර්. එච්. වයිට්හෝර්න්,
බස්නාහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 3වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

1——J. N. 51812—137 (12/35)

S 1

LH 822A

## ආණ්ඩුවේ බදු විකිණීම.

මෙහි පහත ලේඛනයේ දක්වන ආණ්ඩුවේ බද්ද පහත දක්වන කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1936ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකට විකිණීම සඳහා ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මුද්‍රකරණලද මෙම ඉල්ලුම්පත්‍ර වර්ෂ 1936ක්වූ ජනවාරි මස 13වෙනි සඳුදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙණ එදිනදී කඩාබලනු ලැබේ. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුවීමට ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ ඉල්ලුම් කරන්නා හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටිය යුතුයි. ලේඛනයේ දෙවෙනි කොටුවේ දක්වන ප්‍රකාර ඉල්ලනු ලබන බද්දේ නම පිටකවරවල සලකුනු කොට ඉල්ලුම්පත්‍ර නොහොත් "ටැන්ඩර්ස්" එක එක බද්දට වෙන් වෙන් වශයෙන් එවිය යුතුයි.

3. බදුමිල වෙන්දේසි දිනෙදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.

4. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ටවත් යම් ගසක් කපන්ටවත් කානු, මායිම්ගල් ආදිය වෙනස් කරන්ටවත් ගස්වල ඵල ද්‍රව්‍ය හැර වෙන කිසියම් දෙයක් ඉඩමෙන් පිට ගෙන යෑමටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

5. ඒජන්ත උන්නාන්සේගෙන් කල්න් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ බද්ද යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

6. ගැණුම්කාරයා විසින් ඉඩම සුද්දෙදින් සහ හොඳාකාරයෙන් තබාගැනීමටත් පලාත් ආණ්ඩු සභාවේ අණපණත් අනුව ක්‍රියාකරන්ටත් ඕනෑය. තවද සියලුම වරිපනම් ගෙවන්ටත් ඕනෑය. තවද බදුකාරයා විසින් 1936 ජනවාරි සහ ජූනි යන මාසවලදී මේ බද්දට ඇතුළත් ඉඩම්වල (ඇළමඟට අයත් තීරුව සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව මගින් පාලනයකරන ඉඩම් කැබලි හැර ඉතිරි බිමෙහි) ලොකු හා හීන් කැලෑව ශුද්ධකොට, එසේ කළබවට කොළඹ උතුරු කොට්ඨාසයේ දිස්ත්‍රික් ඉංජිනේරු මහතාගෙන් සහතිකයක් ලබාගත යුතුයි.

7. මුලු ඉඩම හෝ, ඉඩමෙන් යම් කොටසක් හෝ, එහි වැවෙන ගස් ආදිය හෝ ආණ්ඩුවට ඕනෑකළොත්, සුමානයක් කල් දුන්විට එවැනි ඉඩම හෝ ඉඩම් කොටස හෝ ගස් ආදිය හෝ ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්ට යෙදෙන ඉඩමට, ඉඩම් කොටසට හෝ ගස්වලට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගත වෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවනු ලැබේ.

8. ඉහත සඳහන් කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැණුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් හෝ ගෙවලින් අහක්කර නැවත භුක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

9. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

අත්සන්කළේ, ආර්. එච්. ලෙච්හෝන්,
බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 3වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

### ඉහතකී බදුවල විස්තර ලේඛනය.

| 1. කඩදාසි නො. | 2. බද්දේ නම. | 3 පිහිටීම. |
|---|---|---|
| LH 822A | තුන්මෝදර සිට දෙහිවල මෝදර දක්වා ඇලට යාකර තිබෙන ආණ්ඩුවේ ඉඩම් තීරුවෙහි තිබෙන පොල්ගස් 259, කොස්ගස් 12, සහ පුවක්ගස් 20 එල ද්‍රව්‍ය ප්‍රයෝජනය ගැණීම | දෙහිවල, කළුබෝවිල සහ කිරිල්ල පොනෙ (මෙයින් කොටසක් දෙහිවල–ගල්කිස්සේ නාගරික දිස්ත්‍රික් සභාවටත් (යූ. ඩී. සී.) ඉතිරි කොටස කෝට්ටේ නාගරික දිස්ත්‍රික් සභාවටත් අයිතිවේ) |

මෙහි පහත දක්වෙන ඉඩම් කොටස් ඉහත සඳහන්කළ බදු ඉඩම්වලට අයිත්නොවේ:—

(1) ප්‍රසිද්ධ වැඩදෙපාර්තමේන්තුවේ උවමනාකම සඳහා වෙන්කර තිබෙන වැල්ලවත්තේ විහාරලේන් පාර සමීපයෙහි පිහිටි ඉඩම් කොටස.

(2) ඇල්. ඩී. ජේමානන්ද යන අයට බදුදී තිබෙන අංක 3,385 දරන මුල් සිතියමේ පෙනෙන ඉඩම් කොටස.

(3) කොළඹ නාගරික සභාවට බදුදී තිබෙන කිරිල්ල පොනේ පාලම සමීපයෙහි පිහිටි අංක 15,556 දරන මුල් සිතියමේ පෙනෙන ඉඩම.

(4) ජේ. ඩී. ඒ. ඇඩ්ව'ඩ් යන අයට බදුදී තිබෙන කිරිල්ල පොනේ පාලම සමීපයෙහි පිහිටි කොටුපොළ.

(5) ඊ. ජේ. එච්. ඩී යන අයට බදුදී තිබෙන කිරිල්ල පොනේ පාලම සමීපයෙහි පිහිටි කොටුපොළ.

(6) පාඨශාලාවක් සහ මිනීකරත්ත මඩුවක් සෑදීමට අසරණධාර බෞද්ධ සමිතියට බදුදී තිබෙන විහාරලේන් පාර සමීපයෙහි පිහිටි ඉඩම් කොටස.

(7) කේ. ඩී. පෙරේරා යන අයට බදුදී තිබෙන විහාරලේන් පාර සමීපයෙහි පිහිටි ඉඩම් කොටස.

---

## අන්‍ය දැන්වීම.

ගම්බන්තොට දිස්ත්‍රික්කයේ කඳුරුපොකුණේ පදිංචි කුමාරසිංහ වන්නිආරච්චිගේ දොන් නිකුලස් වන මම ගාල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරණු පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගියතැනදී රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කරණබව 1907වන වර්ෂයේ අංක 1 දරණ ආඥාපණතේ 1B දරණ උපලේඛනයේ දෙවෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි

27. 12. 1935. ඩී. ඇන්. ඩබ්ලිව්. කුමාරසිංහ.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.